# මහජන බැංකුව

## (ණය මුදල ලබා දීමේ ක්‍රියාපටිපාටිය හා කොන්දේසි)

**රජයේ විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂක සිසුන්ට ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම පිණිස ලබා දෙන පොලී රහිත ණය පහසුකම්**

ණය මුදල අයදුම් කිරීමේදී ශිෂ්‍ය / ශිෂ්‍යාවන් විසින් බැංකු ශාඛාව වෙත පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

I. ණය මුදල ලබා ගැනීම පිණිස අදාල විශ්ව විද්‍යාලය මගින් නිකුත් කරන ලද නිර්දේශිත ලිපිය.
II. විශ්ව විද්‍යාලය මගින් නිකුත් කරන ලද ශිෂ්‍ය හැඳුනුම්පත / ශිෂ්‍ය වාර්තා පොත සමඟ එහි ජායාරූපය අඩංගු කොටසේ ජායා පිටපතක්.
III. ලැප්ටොප් පරිගණක අලෙවි කරනු ලබන ආයතනය / වෙළඳහිමියා / සැපයුම්කරුගෙන් ලබාගත් ඉන්වොයිසිය.
IV. ශිෂ්‍යයාට / ශිෂ්‍යාවට මහපොල / ශිෂ්‍යාධාර බැරවන මහජන බැංකු ගිණුම් පොත ( ගිණුමක් නොමැති නම් නව ගිණුමක් විවෘත කිරීමට පියවර ගත යුතුය).
V. ඇපකරුගේ ශිෂ්‍ය හැඳුනුම්පත / ශිෂ්‍ය වාර්තා පොතෙහි ජායා පිටපත.
VI. ණයකරුගේ හා ඇපකරුගේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් සහ ජායා පිටපත්.

මීට අමතරව ණය පහසුකම් ලබා දීමේදී පහත සඳහන් කරුණු කෙරෙහිද අවධානය යොමු කරනු ලැබේ.

I. ණය මුදල සඳහා සුරකුම් ලෙස රජයේ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවකගේ පුද්ගල ඇප ලබාගැනීමට කටයුතු කරන අතර, එක් ශිෂ්‍යයෙකුට / ශිෂ්‍යාවකට ඇපකරුවෙකු ලෙස ඉදිරිපත්විය හැක්කේ එක් වරක් පමණි.
II. තවද, අයදුම්කරුවන් / ඇපකරුවන් කිසිදු බැංකුවක / මූල්‍ය ආයතනයක ණය ගෙවීම් පැහැර හැරී අයෙකු නොවිය යුතුය.
III. ශාඛාවෙන් නිකුත් කරන ණය අයදුම්පත හා ඇපකරු ප්‍රකාශය නිවැරදිව සම්පූර්ණ කර ඉහත සඳහන් ලියවිලි ද සමඟ ශාඛාව වෙත භාරදිය යුතුය.
IV. බැංකුවෙන් ලබාදෙනු ලබන උපරිම ණය මුදල රු. 75,000.00/-ක් වන අතර, ඊට වැඩි වටිනාකමකින් යුත් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමේදී වැඩිපුර අවශ්‍ය මුදල ගනු දෙනු කරු විසින් දැරිය යුතුය. ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා එම යන්ත්‍රය අලෙවි කරනු ලබන ආයතනය / වෙළඳ හිමියා / සැපයුම්කරු වෙත ගෙවීම් ඇණවුමක් මගින් සෘජුවම ගෙවීම් කිරීමට පියවර ගනු ලැබේ.
V. ණය මුදලේ ආපසු ගෙවීමේ කාලය වසර 03ක් වන අතර, ණය මුදල නිදහස් කල දින සිට මාසික ණය වාරිකය ගෙවීමට අයදුම් කරු කටයුතු කළ යුතුය.